# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1773 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 28/11/2024<br>පැය 1850 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශයේ නිල ලාංඡනය භාවිතා කරමින් අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන අපරාධ සම්බන්ධව - ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශය.**

ශ්‍රී ලංකා පොලිසිය විසින් ළමුන්ට හා කාන්තාවන්ට මුහුණ දීමට සිදුවන අපරාධ සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශයේ අධීක්ෂණය යටතේ විශේෂ මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කර ඇත. එම මෙහෙයුම් මැදිරියට 109 යටතේ සම්බන්ධ වී පැමිණිලි ඉදිරිපත් කල හැකි අතර එවැනි පැමිණිලි ඔවුන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි එම කාර්යංශය මඟින් විමර්ශනය කරනු ලබයි.

මෙලෙස ස්ථාපිත කර ඇති 109 මෙහෙයුම් මැදිරියේ රාජකාරි නියුතු නිලධරයන් විසින් විමර්ශන වලට අදාල තොරතුරු පැමිණිලිකරුවන්ගෙන් ලබා ගනු ලබන අතර මෙම මෙහෙයුම් මැදිරියේ රාජකාරී නිරත නිලධරයන් ලෙස ව්‍යාජ අන්දමින් පෙනී සිටි පිරිසක් විසින් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශයේ නිල ලාංඡනය යොදා ගෙන “sl remover” හා “SL protection” නමින් ව්‍යාජ ලෙස සකස් කරන ලද Whatsapp, Telegram හා විවිධ සමාජ මාධ්‍ය යොදා ගනිමින් අදාල ඡායාරූප හා තොරතුරු ලබා ගැනීම සිදු කර ඇති බවට පැමිණිලි වාර්තා වී ඇත.

මෙම ගිණුම් සමඟ සම්බන්ධ වී ළමුන් හා කාන්තාවන් සමඟ අන්තර්ජාලය හරහා පණිවිඩ හුවමාරු කර අන්තර්ජාලයේ පල වූ ඡායාරූප නැවත යොදා ගනිමින් ඔවුන්ට විවිධ බලපෑම් හා තර්ජන සිදු කරන බවට ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශයට පැමිණිලි කර ඇත.

ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශ විසින් මේ ආකාරයට කිසිදු විවිධ සමාජ මාධ්‍ය සමූහයන් පවත්වාගෙන නොයන අතර ළමුන් හා කාන්තාවන්ට සිදුවන පැමිණිලි හා තොරතුරු ඉදිරිපත් කල හැක්කේ 109 සෘජු දුරකතන අංකයට පමණක් වේ. මින් ඉදිරියට පහත සඳහන් නිල ලාංඡනය යොදා ගනිමින් නිර්මාණය කර ඇති කිසිදු ගිණුමකට ඔබගේ පුද්ගලික තොරතුරු ලබා නොදෙන ලෙසට ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශය

ඉල්ලා සිටින අතර එලෙස තොරතුරු ඉල්ලීමක් සිදුකරයි නම් 109 මෙහෙයුම් මැදිරියට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය දැනුවත් කරන මෙන් තවදුරටත් ඉල්ලා සිටිමි. මේ පිළිබඳව මහජනතාව දැනුවත් වීම සඳහා පූර්ණ ප්‍රචාරයක් ලබා දෙන ලෙස ඔබ මාධ්‍ය ආයතනයෙන් ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

